# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No DSD/HO/MF/05/07/SBSL/2022 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2022.11.09 |

දිස්ත්‍රික් ලේකම් වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශිය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ වරුන් වෙත,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සඳහා සමෘද්ධි කළමනාකරුවන් පත් කිරීම</u>**

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ VII කොටසේ 29,30,31,32 වගන්ති වල සමෘද්ධි බැංකු සමිතිවල පරමාර්ථ,බලතල,හා කාර්යභාරය සටහන් කර ඇති අතර සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති වල පරමාර්ථ ඉටුකර ගැනිම සඳහා පනත ප්‍රකාරව ලබා දී ඇති බලතල හා කාර්යභාරයන් ක්‍රියාත්මක කල යුතුවේ.

ඉහත සමාංක දරණ DSD/HO/MF/5/07/SBSDL/2022 හා 2022/08/23 දිනැති ලිපිය මගින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්ගේ රාජකාරි ලැයිස්තුව ලබා දී තිබේ.ඒ අනුව සමෘද්ධි බැංකු සමිති භාර කළමනාකරුවන්ගේ විෂය පථය විශාල පරාසයක් තුල විහිදී පවති. **"දිවිනැගුම ප්‍රජාමූල බැංකු සම්බන්ධිකරණය කරමින් ජීව්‍ය ප්‍රාදේශිය බැංකු ජාලයක් පිහිටුවීම"**(පනතේ 30 අ)සමෘද්ධි බැංකු සමිතිවල ප්‍රමුඛ පරමාර්ථය වේ. මෙවැනි වගකීම් ඉටුකිරීම පිණිස කාර්යක්ෂම තාවයකින් හෙබි ඉලක්ක කාර්ය සාධන මට්ටම් ලගා කර ගත් කළමනාකරුවන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවලට පත්කර ගත යුතු වේ.

කෙසේ නමුත් දැනට දිවයින පුරා ඇති සමෘද්ධි බැංකු සමිති සඳහා පත්කර ඇති නිළධාරින් පිළිබඳව කරුණු නිරීක්ෂණයේදී පැහැදිලි වනුයේ අදාල කාර්ය සාධන මට්ටම් නොසලකා සමෘද්ධි බැංකු සමිති වලට නිළධාරීන් අනුයුක්ත කර ඇති බවකි.

මෙම අයහපත් තත්වය වහාම මග හරවා ගැනීම පිණිස ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් කළමණාකරුවන්ගේ ස්ථාන මාරු වලදී කාර්ය සාධන මට්ටම් සලකා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා කළමණාකරුවන් පත්කිරීම පිළිබඳව දැඩි සේ සැලකිල්ලක් දක්වන මෙන් කාරුණිකව දන්වමි.

සමෘද්ධි වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගයට කෘතඥ වෙමි.

ආර්.පී.බී.තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | | |
|---|---|---|
| 01.ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.පි |
| 02.ප්‍රධාන අභ්‍යන්තර විගණක ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | දැ.ගැ.පි හා අ.ක.ස |
| 03.ගරු සභාපති,සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහ සංගමය | - | කා.දැ.ගැ.පි |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2 |